*සැ. යු.* - 2011.06.03 දින පළ වූ අංක 1709 දරන *ගැසට් පත්‍රයේ* I-II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.
මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,710 - 2011 ජුනි මස 10 වැනි සිකුරාදා - 2011.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 960 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 963 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජුනි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජුනි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### නිකවැරටිය ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට වඩා වැඩි කාලයක් ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*උපලේඛනය*

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන හා අර්ධ ශිල්පීය ගණයට අදාළ පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම්

| *තනතුර* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| නළ ළිං පොම්ප ක්‍රියාකරු | 111 ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | 6/2006 (iv)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පී. එල්. 2-2006 ඒ අනුව රු. 12,210-10x130-10 x145-10x160-12x170 රු. 18,600 |
| වැඩ පරිපාලක | ප්‍රාථමික අර්ධ ශිල්පීය 111 | 01 | -එම- |
| කාර්යාල කාර්ය සහායක | 111 ශිල්පීය නොවන | 01 | 6/2006 (iv)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පී. එල්. 1-2006 ඒ අනුව රු. 11,730-10x120-10 x130-10x145-12x160 රු. 17,600 |

### නල ළිං පොම්ප ක්‍රියාකරු තනතුර

*අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) බාහිර අයදුම්කරුවන් සඳහා ;

අ.පො.ස. සා. පෙ. විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 2 කින් සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

(*ආ*) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ;

1. පළාත් සභා රාජ්‍ය සේවයේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු (පී. එල්. 1/2006 වැටුප් ක්‍රමය හිමි) අයදුම්කරුවන් රජය විසින් අනුමත පාසැලකින් 08 ශ්‍රේණිය (9 වසර) සමත්වී තිබිය යුතුය.

*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා.-* තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳව වී. කිව්. 1- එන්. වී. කිව් 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබාතිබීම.

*පළපුරුද්ද .-* අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර දෙකකට වැඩි කාලයක් සේවය කර තිබිය යුතුය. (සහතික මඟින් සනාථ කළ යුතුය)

*බඳවාගැනීමේ ක්‍රමය.-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම්ලත් අයදුම්කරුවන් බඳවා ගැනේ. දැනටමත් සභාවේ සේවයේ නියුතු පී. එල්. 1 වැටුප් ක්‍රමයට අදාළ තනතුරු දරන අය සඳහා ද වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

*පොදු කොන්දේසි :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
4. දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
5. නිකවැරටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය, වසමේ ග්‍රාම නිලධාරි සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

6. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

*වැඩ පරිපාලක තනතුර*

i. (අ) බාහිර අයදුම්කරුවන් සඳහා
අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

ii . (ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා
පළාත් සහා රාජ්‍ය සේවයේ නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු (පී. එල්. 1 වැටුප් ක්‍රමය හිමි) අයදුම්කරුවන් රජය විසින් අනුමත පාසැලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබිය යුතුය.

*අවශ්‍ය ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා* .- තනතුරට අදාල වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ එන්. වී. කිව් 02 හෝ 03 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

*පළපුරුද්ද*.- අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථාවල හා ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයක හෝ යටතේ පිරිසෙයින් වසර 2 කට වැඩි කාලයක් සේවය කර තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

*ප්‍රාථමික ශිල්පීය නොවන තනතුර*

වැටුප් ක්‍රමය.-6/2006 (iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි පී.එල් 1-2006 ඒ රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600

*අධ්‍යාපන සුදුසුකම්* .- අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 2 ක් වත් සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

බඳවාගැනීමේ ක්‍රමය.- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණක ප්‍රතිඵල මත සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් බඳවාගනු ලැබේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

උපලේඛනයේ සඳහන් සියළු තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන්නේ අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළ සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේනම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වී තිබේනම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

*අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියළුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2011.07.31 දිනයට පෙර ලැබෙන සේ, ලේකම්, ප්‍රාදේශීය සභාව, නිකවැරටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ "................... තනතුරු සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනු පිටපත් ඇමිණිය යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. හැඳුනුම්පතේ පිටපතක්
4. ග්‍රාම නිලධාරී සහතිකය
5. පළපුරුද්ද පිළිබඳ සහතිකය (නළ ළිං පොම්ප ක්‍රියාකරු තනතුර සහ වැඩ පරිපාලක තනතුර සඳහා)
6. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වන්නේ නම් සේවා සහතිකය
7. තනතුරුවලට අදාළ ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා සහතික

බී. එම්. විජේරත්න,
ලේකම්,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2011 මැයි මස 19 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ වැඩ පරිපාලක හා නළ ළිං පොම්ප ක්‍රියාකරු තනතුරු සඳහා වූ අයදුම්පත්‍රය*

01. *(අ)* මුලකුරු සමග නම :———————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————.
02. පෞද්ගලික ලිපිනය :———————.

03. *අ.* උපන් දිනය:

අවුරුද්ද :———————. මාසය:———————. දිනය:———————.
*ආ.* 2011.01.31 දිනට වයස :
අවුරුදු : ———————. මාස :———————. දින:———————.

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :——————.
05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ද ? එසේනම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන් ද? :——————.
06. ස්ත්‍රී පුරුෂ භාවය : ——————.
07. විවාහක /අවිවාහක බව: ——————.
08. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. සා. පෙළ විභාග අංකය:——————. වර්ෂය : ——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

09. ශිල්පීය නිපුණතා : ලබාගත් ආයතනය : ——————.
ලබාගත් සහතික : ——————.
10. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද : ——————.
11. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේද ?
12. එසේ නම් දඬුවමේ ස්වභාවය : ——————.
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර : ——————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවුත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරාගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ශිල්පීය නොවන තනතුර සඳහා වූ අයදුම්පත්‍රය*

01. *(අ)* මුලකුරු සමග නම :——————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. පෞද්ගලික ලිපිනය :——————.
03. උපන් දිනය:
අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.
අ. 2011.01.31 දිනට වයස :
අවුරුදු : ——————. මාස :——————. දින:——————.
04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :——————.
05. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ? එසේනම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන් ද? :——————.
06. ස්ත්‍රී පුරුෂ භාවය : ——————.
07. විවාහක /අවිවාහක බව: ——————.
08. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. සා. පෙළ විභාග අංකය:——————. වර්ෂය : ——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද : ——————.
10. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේ ද ?
11. එසේ නම් දඬුවමේ ස්වභාවය : ——————.
12. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර : ——————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවුත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරාගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*ආයතන ප්‍රධානියාගේ නිරදේශය*

................................. යන අය මෙම ආයතනයේ ................................. තනතුරෙහි ................. දින සිට ................. දින දක්වා සේවය කරන අතර, ඉහත තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ——————.

06-110

# පළාත් පාලන නිවේදන

## බළපිටිය ප්‍රාදේශීය සභාව

### වීථි නම් කිරීමේ සංශෝධිත නිවේදනය

අංක 1691 හා 2011.01.28 දිනැති *ගැසට් පත්‍රයේ (iv)* (ආ) පළාත් පාලන කොටස් 447 පිටුවේ බළපිටිය ප්‍රාදේශීය සභාවේ වීථි නම් කිරීමේ නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුයි.

බළපිටිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ නම් සඳහන් මාර්ග වීථි උපලේඛනයේ යෝජිත නම් යටතේ නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරන ලදුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වැනි වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ගරු අමාත්‍යතුමා විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව පහත මාර්ගය මින් ඉදිරියට යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බැව් මින් ඉදිරියට නිවේදනය කරමි.

| *මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|
| අහුන්ගල්ල, ගාලු පාර, 76/1, බෝක්කුව අසලින් මුහුදු වෙරළට යන මාර්ගය | සිරිරත්න ලියනගේ වෙරළ පිවිසුම් මාර්ගය |

ඒ. දයාරත්න ද සිල්වා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
බළපිටිය.

06-108

---

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, මහව ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ වයඹ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව, මෙයින් පළකරනු ලැබේ.

*යෝජනාව*

(267 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයේ පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුලුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සියයට දහයකට (10%) සමාන බද්දක් පනවා අයකළ යුතු යැයි ද, මෙම යෝජනා සම්මතය ගැසට් පත්‍රයේ පළකරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නීය.

අතුල සරත් කුමාර විජේසිංහ,
ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රම
සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන, පළාත් පරිපාලන,
මිනිස්බල අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන
පරිසර, සංචාරක, ආයෝජන, සම්බන්ධීකරණ, සමූපකාර,
සංවර්ධන සහ ආහාර සැපයුම් හා
බෙදාහැරීමේ අමාත්‍යාංශය, වයඹ පළාත.

වයඹ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

06-177

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.